# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1927/49 - 2015 අගෝස්තු මස 12 වැනි බදාදා - 2015.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 22 වැනි වගන්තියෙන් විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ නිකුත් කරනු ලබන නියෝග.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2015 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මෙම නියෝග 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816 හා 2013.06.21 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කළ නියෝගයට අදාළ සංශෝධනයකි. එම නියෝගයේ 02 (ii) හා 02 (iii) හි කරුණුවලට මෙම සංශෝධනය අදාළ නොවේ.

02. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන -

i. ජනප්‍රිය පාසල්වලට සිසුන් තෝරා ගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පවත්වන විභාගය

ආරම්භක දිනට පූර්වයෙන් වූ දින 3කට පෙර සිට විභාගය අවසන් වන දින දක්වා සම්පූර්ණ කාලය තුළ එම විභාග අපේක්ෂකයන් සඳහා උපකාරක පන්ති සංවිධානය කිරීම, එම පන්ති මෙහෙයවීම, විෂයානුබද්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම, එම විභාගය සඳහා අනුමාන ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම, ඒවා බෙදාහැරීම, විභාග ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න ලබාදෙන බවට හෝ ඒ හා සමාන ප්‍රශ්න ලබාදෙන බවට පෝස්ටර්, බැනර්, අත්පත්‍රිකා, විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කිරීම හෝ එවැනි දෑ ළඟ තබා ගැනීම සපුරා තහනම් ය. යම් අයෙක් හෝ ආයතනයක් හෝ වෙනත් පාර්ශවයක් මෙකී නියෝග නොසළකා ක්‍රියා කරනු ලැබුවහොත් ඒ තැනැත්තා හෝ ආයතනය හෝ එම පාර්ශවය මෙම පනත යටතේ වරදකරුවෙකු වන්නේ ය.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, පැලවත්ත,
බත්තරමුල්ල.

1A - PG 2496 — 806 (2015/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*